අවසාන වාර පරීක්ෂණය – www.eduLanka.LK

ඉතිහාසය 1 කොටස 10 ශ්‍රේණිය කාලය පැය 1 යි

- ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. " වර්තමානය හා අනාගතය අනිවාර්යයෙන්ම අතීතයෙන් ගොඩ නැගෙන අතර එම මුද්‍රාව එහි දක්නට ලැබෙනු ඇත. එය අමතක කිරීම අත්තිවාරමක් නැතිව ඉදි කිරීමක් වැනිය." ඉතිහාසය පිළිබඳ මෙම ප්‍රකාශය කරන ලද්දේ
   1) ඒබ්‍රහම් ලින්කන්
   2) ජවහල්ලාල් නේරු
   3) ඊ. එච් කාර්
   4) මහත්මා ගාන්ධි
2. පහත සඳහන් ඒවායින් පැරණි ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරභාවය දුර්වල කිරීමට තුඩු දුන් අවස්ථා ඇතුලත් වන්නේ කිනම් පිළිතුරේද ?
   1) පණ්ඩුවාසුදේව ඇතුළු පිරිස පැමිණීම
   2) පුලහත්ථ ඇතුළු පිරිස පැමිණීම
   3) කාලිංග මාඝගේ පැමිණීම
   4) දීඝායු සහ පිරිස පැමිණීම
3. පහත 1 තීරුවේ දක්වා ඇති වාරි කර්මාන්තය හා සම්බන්ධ නිර්මාණ අනුපිළිවෙලින් අංක 2 තීරුවෙහි ඇති කරුණු හා ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

| 1 තීරුව | | 11 තීරුව | |
|---|---|---|---|
| A | බිසෝ කොටුව | E | ස්වාභාවික ගල් තලාවක් උපයෝගී කරගෙන සොරොව්ව තැනීම |
| B | ජය ගඟ | F | වැවේ ජල පීඩනය පාලනය කිරීම |
| C | මඩ සොරොව්ව | G | බෑවුමේ අනුක්‍රමණය අවම වනසේ ඇල පත්ල සකස් කිරීමේ නිපුනතාව |
| D | සලපනාව | H | වැව ගොඩවීම වැලැක්වීම |
| | | J | වැව් බැම්ම ඇතුළු පැත්ත ආරක්ෂා කිරීම |

   1) BFGH 2) FJHE 3) FGHJ 4) JGFE
4. ලම්බකරණ පෙලපතේ අවසාන පාලකයා වූයේ පහත සඳහන් කවරෙක්ද ?
   1) වසභ රජු 2) මහසෙන් රජු 3) වළගම්බා රජු 4) මිත්සෙන් රජු
5. යාපනේ ආර්ය චක්‍රවර්තී විසින් සිය පාලනයට ගෙන තිබූ මන්නාරම සිට පානදුර දක්වා වූ බටහිර වෙරළේ පිහිටවූ තොටුපලවල් සියල්ල එයින් නිදහස් කර ගැනීමේ ගෞරවය හිමි වන්නේ
   1) සේනාධිලංකාර සෙනෙවියාට
   2) නිශ්ශංක අලගක්කෝනාර
   3) අම්බුළුගල කුමාරයාට
   4) සපුමල් කුමාරයාට
6. වයඹ දිග දේශ සීමා ඔස්සේ ඉන්දියානු ප්‍රදේශවලට ආක්‍රමණ හා සංක්‍රමණ බොහෝමයක් සිදුවූ දුර්ග මාර්ග වූයේ
   1) ඛයිබර් 2) ගෝවල්ය 3) බෝලාන් 4) මක්රාන්
7. මෞර්ය අශෝක අධිරාජයාගේ පාලන සංවිධානය තුල " ධර්ම මහාමාත්‍ර" නම් නිළධාරීන්ට පැවරුණු කාර්යය වූයේ
   1) ඉන්දියාව තුල බුදු දහමේ උන්නතියට කටයුතු කිරීම
   2) රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමය
   3) අශෝකගේ ධර්මය අධිරජ්‍ය තුල ක්‍රියාත්මක කිරීමය
   4) ඉන්දියාවෙන් පිටත ප්‍රදේශවල බුදු දහම ව්‍යාප්ත කිරීමය
8. ඉන්දියාවට පැමිණි මුල් මුස්ලිම් ආක්‍රමණිකයන් වැඩි දෙනෙකුගේ මූලික අරමුණ වූයේ
   1) වයඹ දිග හා උතුරු ඉන්දියාවේ රාජ්‍යවල ධනය කොල්ල කෑමය
   2) ඉන්දියාවේ වෙළඳ බලය අල්ලා ගැනීමය
   3) වයඹ දිග හා උතුරු ඉන්දියාවේ ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත කිරීමය

4) උතුරු ඉන්දියාවේ දේශපාලන ආධිපත්‍යය ලබා ගැනීමය

9. රාජධානි නිරිත දෙසට සංක්‍රමණය වූ අවදියේදී ශ්‍රී ලංකාවේ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් ලක්ෂණය වූයේ මින් කුමක්ද
   1) දේශීය වෙළඳ ද්‍රව්‍ය අතර කුරුඳු ඇතුළු කුළු බඩු ප්‍රධාන තැනක් ගැනීම
   2) ප්‍රධාන වශයෙන්ම මුදල් පදනම් කරගත් වෙළඳාම් ක්‍රමයක් වීම
   3) අසල්වැසි රටවල් සමග පමණක් ගනුදෙනු සිදුවීම
   4) වෙලඳ කටයුතු දකුණු ඉන්දීය ජාතිකයන් විසින් මෙහෙයවීම

10. " ෂඩ්භාෂා පරමේශ්වර" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ ලංකාව එක් සේසත් කලඅවසන් පාලකයා වන්නේ
   1) 1 පරාක්‍රමබාහු රජු
   2) 11 පරාක්‍රමබාහු රජු
   3) vi පරාක්‍රමබාහු රජු
   4) iv පරාක්‍රමබාහු රජු

11. පහත සඳහන් රටවල් අතරින් යුරෝපයේ මුල්ම ජාතික රාජ්‍ය ලෙෂ හැඳින්වෙන්නේ
   A - පෝලන්තය B - ඉතාලිය C - එංගලන්තය D - ස්පාඤ්ඤය E - ජර්මනිය F - ප්‍රංශය
   1) COE 2) ABC 3) ACD 4) CDF

12. X තීරය හා Y තීරය ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක්ද?

| X | Y |
|---|---|
| 1. ජෝර්ජ ස්ටීවන්සන් | A - දුවන නඩාව |
| 2. ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම්බෙල් | B - දුම්රිය එන්ජිම |
| 3. හම්ප්‍රි ඩේවි | C - දුරකතනය |
| 4. ජෝන් තේ | D - වාෂ්ප එන්ජිම |
| | E - විදුලි පණිවිඩ ක්‍රම |
| | F - ආරක්ෂක ලාම්පුව |

   1) ACDE 2) BCFA 3) ABDF 4) CDEF

13. නවරත්න නම් කවීන් විසූ බව සඳහන් වන්නේ කවර රාජ්‍ය පාලන සමයේද?
   1) සමුද්‍ර ගුප්ත රජ සමයේ
   2) චන්ද්‍ර ගුප්ත රජ සමයේ
   3) කුමාර ගුප්ත රජ සමයේ
   4) ස්කන්ධ ගුප්ත රජ සමයේ

14. නිදහස සමානාත්මතාව සහ සහෝදරත්වය යන සටන්පාඨය කවර විප්ලවයන් හා සම්බන්ධ වේද?
   1) ඇමරිකානු විප්ලවය
   2) ප්‍රංශ විප්ලවය
   3) ඉංග්‍රීසි විප්ලවය
   4) රුසියානු විප්ලවය

15. අංකෝර් නමැති සිද්ධස්ථානය පිහිටි රට කුමක්ද?
   1) බුරුමය 2) තායිලන්තය 3) කාම්බෝජය 4) වියට්නාමය

16. පහලොස්වන සියවසේදී කොන්ස්තන්තිනෝපලය වැදගත් වූයේ
   1) බටහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වීම
   2) දේශ ගවේශනයට පුහුණුවක් ලබාදෙන මධ්‍යස්ථානයක් වීම
   3) පෙර අපරදිග වෙළඳ සබඳතා ගොඩ නගනලද මධ්‍යස්ථානයක් වීම
   4) රෝමානු කතෝලිකයන්ගේ ශුද්ධ භූමිය වීම

17. ඉතාලිය එක්සත් කිරීමේදී කාබොනාරි ව්‍යාපාරය නම් රහස් සංවිධානය පිහිටුවීමේ නායකත්වය ගත්තේ
   1) රෝසප් වැසීන්
   2) නැපෝලියන්

3) ගැරිබෝල්ඩි
4) කවුන්ට් කැමිලෝ

18. වැඩවසම් යුගය අවසානයේ මිනිසා උසස් කර සැලකීම තුලින් ඉස්මතු වුයේ
1) උපයෝගිතාවාදයයි
2) වාණිජවාදයයි
3) භෞතිකවාදයයි
4) මානවවාදයයි

19. කාර්මික විප්ලවය නිසා ඇති වු සමාජීය ප්‍රතිඵලයන් වන්නේ
1) නගරවල සංඛ්‍යාව හා විශාලත්වයද සීඝ්‍රයෙන් වර්ධනය වීම
2) ආනයන හා අපනයන වෙළඳ රටාවන් බිහිවීම
3) වෙළඳ අරමුණු ඉටුකර ගැනීමේ බද්ධ ව්‍යාපාර සමාගම් බිහිවීම
4) මුල්‍ය හා බැංකු සේවා කටයුතු වල විශාල වර්ධනයක් ඇතිවීම

20. ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය යනු
1) ඉඩම වටා වැටක් ගසා කොටු කිරීමයි.
2) කුඩා ගොවි බිම් එක් කර විශාල ගොවිබිම් සැදීමයි.
3) විශාල ඉඩම් කුඩා කැබලි වලට වෙන්කර වැට ගැසීම.
4) ඉඩම කොටුවක් ආකාරයට තාප්පයක් බැඳීමයි.

21. 1818 කැරැල්ල සඳහා බලපෑ හේතුවක් නොවන්නේ
1) පැරණි නීති අනුව රට පාලනයට පොරොන්දු වී ඉංග්‍රීසීන් එය කඩ කිරීම
2) භික්ෂුන් වහන්සේලාට ගරු නොකිරීම
3) උඩරට ප්‍රභුන්ගේ ආර්ථිකය බිඳ වැටීම
4) ටොරින්ටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්තිය

22. ඕලන්ද ජාතිකයන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය වුයේ
1) ගෝව
2) බතාවිය
3) මුම්බායි
4) කල්කටා

23. දේශ ගවේෂණයේදී ක්‍රිස්ටෝපර් කොලොම්බස් විසින් සොයා ගන්නා ලද්දේ
1) හිස්පැණියෝලාව
2) කුණාටු තුඩුව
3) ඇමරිකාව
4) පිලිපීනය

24. කුරුස යුද්ධ යනුවෙන් හැඳින්වෙන්නේ කවර ඓතිහාසික සිද්ධියක්ද?
1) ක්‍රිස්තු භක්තිකයන්ගේ ශුද්ධ භූමිය තුර්කින් අල්ලා ගැනීම
2) කැරලොන්රියන්වරුන් හා හං වරුන් අතර ඇතිවු ගැටුම
3) ක්‍රිස්තු භක්තිකයන් හා ඉස්ලාම් භක්තිකයන් අතර ජෙරුසලම සම්බන්ධයෙන් ඇති වු ගැටුම
4) වන්දනාවේ ගිය රෝමානු කතෝලිකයන්ට පලස්තීනයේ පහර දීම

25. මුස්ලිම් පාලකයෙකු වුවත් අන්‍ය ආගමිකයන් කෙරෙහි සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද්දේ
1) මහා අක්බාර් රජතුමා
2) සාජහාන්
3) අලා උද්දීන්
4) බාබුර්

26. මයුර සංදේශය තිසර සංදේශය සද්ධර්ම ලංකාරය ආදී ප්‍රසිද්ධ ග්‍රන්ථ අයත් වන්නේ කුමන යුගයකටද?
1) ගම්පල යුගයට
2) කෝට්ටේ යුගයට
3) කුරුණෑගල යුගයට
4) දඹදෙණි යුගයට

27. කඳු රහිත ප්‍රදේශයක උසින් අඩු චාපාකාර හැඩයකින් යුත් වැව් බැම්මක් ඉදිකර නිර්මාණය කර ඇති වැව කුමක්ද?
1) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි කන්තලේ වැව
2) පොලොන්නරුවේ ගිරිතලේ වැව
3) අනුරාධපුරයේ පිහිටි නාච්චදුව වැව
4) මන්නාරමේ පිහිටි යෝධ වැව

28. යාපනයේ ආර්ය චක්‍රවර්ති යටතේ පිහිටි තොටුපලවල් නිදහස් කර ගැනීමේ ගෞරවය හිමි වන්නේ

www.eduLanka.LK

1) සේනාධිලංකාර සෙනෙවිරදුන්ටය
2) නිශ්ශංක අලගක්කෝනාරටය
3) අම්බුලුගල කුමාරයාටය
4) සපුමල් කුමාරයාටය

29. කාර්මික විප්ලවයෙන් පසු නැගී ආ ධනේෂ්වර පංතියට න්‍යායාත්මක පදනමක් තර්කානුකූලව ලබා දුන්නේ
1) ඇඩම් ස්මිත් විසිනි
2) කාල් මාක්ස් විසිනි
3) ඇල්ප්‍රඩ් මාෂල් විසිනි
4) ඩේවිඩ් රිකාඩෝ විසිනි

30. අග්නි හා වරුණ දෙවියන්ට ඉන්දියාවේ ආර්යයන්ගේ ඇදහීම් අනුව හිමිවන්නේ ඉතා වැදගත් තැනකි. මේ දෙවියන්ගේ අධිපතිත්වයෙන් පාලනය වන්නේ
1) ආකාශය හා පොළවයි
2) ගින්න හා වැස්සයි
3) ඉර හා හඳයි
4) පිරිමියා හා ගැහැණියයි

31. "වේලි" නම් බද්ද අය කරනු ලැබුයේ
1) ගැමි ජනතාවගෙනි
2) ලුණු සඳහායි
3) ණාගරික ජනතාවගෙන්
4) ව්‍යාපාරිකයන්ගෙන්

32. ආරාම පාලනය ගැන සඳහන් වන සෙල්ලිපියක් වන්නේ
1) බදුලු ටැම් ලිපිය
2) ගල්පොත ශිලා ලේඛනය
3) කළු දිය පොකුණ ලිපිය
4) සිතුල් පව්ව සෙල් ලිපිය

33. ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් ක්‍රි.ව. 1602 දී ලංකාවට පැමිණෙන අවධියේ ලංකාවේ උඩරට පාලකයා වුයේ
1) 11 විමලධර්මසූරිය රජු
2) 1 විමලධර්මසූරිය රජු
3) 1 රාජසිංහ රජු
4) 11 රාජසිංහ රජු

34. බ්‍රිතානය පාලන සමයේදී ලංකාවේ ප්‍රථම ආණ්ඩුකාරවරයා වුයේ
1) පෙඩ්රික් නෝර්ත්
2) රොබට් බ්‍රවුන්රිග්
3) තෝමස් මෙට්ලන්ඩ්
4) රොබට් චාර්මස්

35. ඉන්දියාවේ 4 වන ධර්ම සංගායනාව පැවැත්වීමේදී මුලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ
1) අශෝක රජතුමා
2) අජාසත්ත රජු
3) කණිෂ්ක රජු
4) කාලාශෝක රජු

36. වැවකින් ජලය ගෙන යාමේදී වැව් බැම්මට වන හානිය වලක්වා ගැනීමට පැරණි රජ දරුවන් නිර්මාණය කර ඇත්තේ
1) බිසෝ කොටුව
2) පිටවාන
3) රළපනාව
4) ඇතුළු වාන

37. ඉන්දියාවේ පිහිටි ඝන රාජ්‍ය 2කි.
1) මගධය හා කෝසල
2) වජ්ජි හා මල්ල
3) වත්ස හා අවන්ති
4) අංග සහ මගධ

38. අශෝක අධිරාජ්‍යයාගේ මෙහෙයවීම මගින් ඉන්දියානු සම්ප්‍රදායට අනුව අභිෂේකයන් පැවැත්වූ පළමු ශ්‍රී ලාංකීය රජතුමා වන්නේ
1) පණ්ඩුකාභය
2) දේවානම්පියතිස්ස
3) දුටු ගැමුණු
4) වලගම්බා

39. ශ්‍රී ලංකාවේ වයඹ දිග වෙරළට ගොඩබට ආර්යයන් විසින් පිහිටුවන ලද ජනාවාස පමණක් දැක්වෙන්නේ
1) තම්බපණ්ණි, අනුරාධගාම, මහාගාම, උරුවෙල ගාම
2) අනුරාධගාම, මහාගාම, දීඝ ගාම, උරුවෙල ගාම

3) තම්බලණ්නී, අනුරාධගාම, උපතිස්ස ගාම, උරුවෙල ගාම
4) අනුරාධගාම, දීඝ ගාම, උපතිස්ස ගාම, උරුවෙල ගාම

40. ක්‍රි. ව. 1836 හා 1766 යන වර්ෂ වලදී ලන්දේසීන් සමග ගිවිසුමට එළඹි පාලකයන් දෙදෙනා වන්නේ
1) 1 විමලධර්මසූරිය හා 11 විමලධර්මසූරිය
2) 11 රාජසිංහ හා කීර්ති ශ්‍රී රාජසිංහ
3) සෙනරත් හා 11 විමලධර්මසූරිය
4) ශ්‍රී නරේන්ද්‍රසිංහ හා ශ්‍රී විජය රාජසිංහ

www.eduLanka.LK

අවසාන වාර පරීක්ෂණය – www.eduLanka.LK

ඉතිහාසය 11 කොටස 10 ශ්‍රේණිය කාලය පැය 3 යි.

පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. 11 කොටසින් ප්‍රශ්න 3කටද 111 කොටසින් ප්‍රශ්න 2කටද පිළිතුරු සපයන්න.

1 කොටස

1. (අ)

I. ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| ගෝකණ්න | කප්පරකන්ද නදි | කොත්මලේ | දඹකොළ පටුන | රිටිගල |
| මහානගහුල | කදම්බ නදි | යෝධ වැව | කුරුවිට | මිණිපේ අමුණ |

II. ලෝක සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| කල්කටාව | පීකිං | කොන්ස්තන්තිනෝපලය | සුවස් ඇළ | ජපානය |
| ඉරානය | නිව්යෝක් | මරේඩාලිං ගග | | |

(ආ)

I. A



I. A පිංතූරයේ දැක්වෙන බුදු පිළිමය කුමක්ද?
II. මෙය නිර්මානය කර ඇත්තේ කොහේද?
III. මෙම පිළිමයෙන් නිරූපණය වන්නේ කවර ගුණයක්ද?
IV. මෙම නිර්මාණයට බලපා ඇත්තේ ඉන්දීය කිනම් ආභාෂයද?

II. B

I. B පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?
II. මෙය කාගේ නිර්මාණයක්ද?
III. මෙහි ඇති ඓතිහාසික වැදගත්කම කුමක්ද?
IV. මෙය කුමන රාජධානි යුගයට අයත්ද?

III. C

I. C පින්තූරයේ ඇති රජතුමා කවුද?
II. මෙතුමාගේ රාජ වංශය කුමක්ද?
III. ඔහු ජීවත් වූ රට කුමක්ද?
IV. මොහු සුවිශේෂී පුද්ගලයෙකු වන්නේ ඇයි?

11 කොටස

2.

I. පහත දී ඇති ගංගා 3 හි ඓතිහාසික නම් ලියන්න.
   A. මල්වතු ඔය
   B. වළවේ ගඟ
   C. මැණික් ගඟ
II. පැරණි ජනාවාස සඳහා භාවිතා කරන වර්තමාන නම් ලියන්න.
   A. දඹකොළ පටුන
   B. මාතොට
   C. දීඝවාපිය
   D. ගෝකණ්න
III. මුල් ආර්යය කණ්ඩායම් වියලි කලාපයට අයත් ගංගා නිම්න තෝරා ගැනීම කෙරෙහි බලපා ඇති හේතු 2ක් පැහැදිලි කරන්න.
IV. මුල් ආර්යය ජනාවාස වල ආර්ථික කටයුතු පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න.

www.eduLanka.LK

3.

I. පහත දී ඇති සාහිත්‍ය මූලාශ්‍ර ලියවී ඇති යුගයන් මොනවාදැයි දක්වන්න.

A. බෝධි වංශය

B. සද්ධර්ම රත්නාවලිය

C. රසවාහිනිය

II. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී ප්‍රයෝජනයට ගතහැකි විදේශ මූලාශ්‍ර 2ක් පහත දැක්වේ. ඒවායේ රචකයන් ලියන්න.

A. ඩුමුන්ඩෝ

B. නැවුරාලිස් හිස්ටෝරියා

III. කෝට්ටේ යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා කවුරුන්දැයි නම් කර ඊට හේතු ඉදිරිපත් කරන්න.

IV. රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීම කෙරෙහි බලපෑ හේතු මොනවාදැයි පැහැදිලි කරන්න.

4.

I. පහත වැව් කරවූ රජවරු පිළිවෙලින් ලියන්න.

A. තිසා වැව

B. කලා වැව

II. ගංගා ආශ්‍රිතව ජනපද පිහිටුවාගෙන එම ජලයෙන් හා වැසි ජලයෙන් ගොවිතැන් කටයුතු කල ආර්යයන්ට පසු කලෙක වාරිමාර්ග ඔහින් ජලය සපයා ගැනීමට අවශ්‍ය විය. එයට බලපෑ කරුණු 4ක් ලියන්න.

III. ඔදා ආර්යයන් වැව් ඉදිකිරීමේදී භූමියේ පිහිටීම වැදගත් සාධකයක් විය. කරුණු 2ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

5.

I. රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු 3ක් ලියන්න.

II. සංක්‍රමණය වීමෙන් පසු පිහිටුවාගත් රාජධානි 4ක් පිළිවෙලින් ලියන්න.

III. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජුගෙන් රාජ්‍ය පාලනයට හා ආගමික වශයෙන් සිදුවූ සේවාවන් සාකච්ඡා කරන්න.

IV. සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය වශයෙන් කෝට්ටේ යුගය සැලකේ. මේ බව සාදක 2 ඇසුරෙන් පැහැදිලි කරන්න.

111 කොටස

6.

I. මෞර්ය රාජ්‍යයේ ආරම්භක රජවරු තිදෙනෙක් ලියන්න.

II. ධර්මාශෝක රජතුමා සාමකාමී ධාර්මික පාලනයක් ගෙන ගිය අතර එතුමාගෙන් සිදුවූ සේවාවන් 4ක් ලියන්න.

III. මෞර්ය යුගයේ සංස්කෘතිය හා පාලනයේ දැකිය හැකි ලක්ෂණ උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

IV. සොලොස් මහා ජනපද අතරින් මගධය නැගීමට බලපෑ හේතු 2ක් පැහැදිලි කරන්න.

7.

I. පහත සඳහන් දේශ ගවේශකයන් පළමු වරට සොයාගත් ස්ථාන පිළිවෙලින් ලියන්න.



www.eduLanka.LK

A. ඇමරිගෝ වෙස්පුචි
B. වස්කෝදගාමා
C. පර්ඩිනන්ඩ් මැගලන්

II. දේශ ගවේශනයේ යහපත් ප්‍රතිඵල 2ක් හා අයහපත් ප්‍රතිඵල 2ක් ලියන්න.

III. පුනරුදය ඇති වීමට හේතු 2ක් ලියා එකිනෙක පැහැදිලි කරන්න.

IV. යුරෝපා රටවල ඇති වූ පුනරුදයත් සමගම විද්‍යාත්මක හා කලා ක්ෂේත්‍රවල සැලකිය යුතු වෙනසක් සිදුවිය. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

8.

I. ශ්‍රී ලංකාව යටත් කරගෙන සිටි බටහිර ජාතීන් 3ක් පහත දැක්වේ. ඔවුන්ගේ මව් රටවල් අනුපිළිවෙලින් ලියන්න.

A. පෘතුග්‍රීසි
B. ලන්දේසි
C. ඉංග්‍රීසි

II. පහත දීඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. පෘතුග්‍රීසීන්ගේ පෙරදිග මුලස්ථානය කුමක්ද?
B. 1 විමලධර්මසූරිය රජුගේ කාලයේ මෙරටට පැමිණි ප්‍රථම ලන්දේසි නියෝජිතයා කවුද?
C. 1638 ලන්දේසි සමග ගිවිසුමට එළඹි රජතුමා කවුද?
D. පෘතුග්‍රීසීන් ලංකාවට පැමිණි වර්ෂය කුමක්ද?

III. විජයබා කොල්ලය නැමැති සිද්ධිය කෝට්ටේ රාජධානිය පෘතුග්‍රීසීන්ට යටත් කරගැනීමට පහසු වීමට හේතු විය. මෙය පැහැදිලි කරන්න.

IV. පෘතුග්‍රීසීන්ගේ පාලනය අවසන් වුවද ඔවුන්ගේ පාලනය නිසා ඇතිවූ බලපෑම් වර්තමාන ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. කරුණු 3ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

www.eduLanka.LK